# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1986 අංක 41 දරන
# අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1986 නොවැම්බර් මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1986 නොවැම්බර් මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 30 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

**1986 අංක 41 දරන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1986 නොවැම්බර් මස 25 වන දින.]

එල්. ඩී.—ඕ. 56/85

**1984 අංක 11 දරන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1986 අංක 41 දරන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. 1984 අංක 11 දරන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනතේ 3 වන වගන්තියේ (1) උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — 1984 අංක 11 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන (මෙහි මින්මතු "පත් කරන ලද සාමාජිකයන්" යනුවෙන් හඳුන්වනු ලබන) මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු එක් සාමාජිකයකුගෙන් සහ වෙනත් සාමාජිකයන් තිදෙනකුගෙන්;

(ආ) අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් හෝ ඔහුගේ නාමිකයාගෙන්;

(ඇ) පොලිස්පතිවරයාගෙන් හෝ ඔහුගේ නාමිකයාගෙන්;

(ඈ) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් හෝ ඔහුගේ නාමිකයාගෙන්;

(ඉ) ප්‍රධාන රේගු අයකැමිවරයාගෙන් හෝ ඔහුගේ නාමිකයාගෙන්;

(ඊ) ආණ්ඩුවේ රස පරීක්ෂකවරයාගෙන් හෝ ඔහුගේ නාමිකයාගෙන්; සහ

(උ) ආයුර්වේද කොමසාරිස්වරයාගෙන් හෝ ඔහුගේ නාමිකයාගෙන්.".

ජ 092801—7,250 (86/09)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1 රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර, දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.